Koggalage, Dilma
PAPER

# උඩරට රාජධානයේ බලපැවති විවාහ නීතිය, කාන්තාව හා දේපළ දැරීමේ අයිතිය

ඩිල්මා තුෂාරි කොග්ගලගේ, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

Dilma Koggalage, Department of History, University of Kelaniya

ආචාර්ය එච්.ඩබ්ලිව්. තම්බයියා දක්වන පරිදි පවුලක දේපළවලට එහි සාමාජිකයන් හවුලේ හිමිකම් කීම ආර්ය ජනවර්ගවලට මෙන්ම ලොව තවත් බොහෝ ජනවර්ගවලට පොදු වූ කරුණකි. භාරතයේ නම් මෙම හිමිකම සාමූහික වගා ක්‍රමය, ග්‍රාමීය ජන කණ්ඩායම් හෝ හවුල් හිමිකම් ස්වරූපයෙන් දක්නට ලැබිණි. එෆ්. ඒ. හේලිගේ අදහස නම් බටහිර බොහෝ සමාජවල විවාහය හේතුකොටගෙන ස්වාමියාගේ හා භාර්යාවගේ දේපළවල යුග්මතාවක් නොහොත් ඒකීයභාවයක් (ජදපපමබසඑහ දෙ චරදචැරඑහ) නෛතික වශයෙන් හටගනී. එනම්, විවාහක කාන්තාවක් එකී විවාහය හේතු කොට ගෙන ස්වාධීනව දේපළ දැරීමට ඇති අයිතිය කිසියම් දුරකට සීමා කරගන්නා බවයි.

පෙර අපර දෙදිග විවිධ සමාජවල දක්නට ලැබුණු මේ තත්ත්වය මෙරට උඩරට රාජධානිය තුළ දක්නට ලැබුණේද යන්න විග්‍රහ කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණයි. උඩරට රාජධානිය නම් ඓතිහාසික සන්දර්භය තුළ කාන්තාවගේ නෛතික තත්තවය පිළිබඳ කරන ලද පර්යේෂණයක ප්‍රතිඵල ඉදිරිපත් කිරීමක් වශයෙන් මෙම සම්මන්ත්‍රණ පත්‍රිකාව හැඳින්විය හැකියි.

16 වනි සියවස පමණ සිට ක්‍රි.ව. 1815 දක්වාත් ඉන්පසුව ඉංග්‍රීසින් යටතේ විවිධ වෙනස්වීම සහිතව දීර්ඝ කාලයක් තිස්සේත් භාවිත වූ උඩරට නීතිය, උඩරට රාජධානිය තුළ ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික චාරිත්‍රමය නීතියයි. මෙම පර්යේෂණය සඳහා පර්යේෂණ ක්ෂෙත්‍රය වශයෙන් තෝරාගන්නා ලද්දේ එකී නීතිය යටතේ පැවති ව්‍යවහාරික හා දේපළ යන නීති අනු කොටස්ය.

පර්යේෂණ ගැටලුව, සමකාලීන පෙරදිග පමණක් නොව බටහිර පවා බොහෝ සමාජවල වෛවාහික නීතිය මගින් පිළිගෙන තිබූ මූලධර්මයක් සේ පෙනෙන 'විවාහයේ දෙපාර්ශවය සතු දේපළ විවාහය හේතු කොට ගෙන යුග්මතාවක් නොහොත් ඒකීයභාවයක් ලබයි' යන්න උඩරට නීතිය ඒ සැටියෙන්ම පිළිගත්තේද? යන්නයි.

මෙහිලා එළඹි උපකල්පනය නම්, උඩරට නීතිය එබඳු යුග්මතාවක් නොහොත් ඒකීයභාවයක් පිළිනොගත් බවයි. මෙම පර්යේෂණ කාර්යයේදී ඓතිහාසික ක්‍රමවේදය භාවිත කරන ලද අතර විශේෂයෙන්ම නීති නිඝණ්ඩුව වැනි ප්‍රාථමික මූලාශ්‍රයයන් කෙරෙහි එහිදී අවධානය යොමු කරනු ලැබිණි.

උඩරට නීතියේ වෛවාහික හා දේපළ නීති ප්‍රතිපාදන එක්ව ගෙන අධ්‍යයනය කොට බැලූ කල පැහැදිලිවනුයේ විවාහය හේතු කොට ගෙන වෛවාහික පාර්ශවයන්ගේ දේපළවල යුග්මතාවක් ඇති නොවූ බවයි; ඒ අනුව, කාන්තාවට විවාහ සංස්ථාව තුළ ස්වාධීන නෛතික පුද්ගලයෙකු වශයෙන් දේපළ දැරීමට තිබූ අයිතිය නීතියෙන් පිළිගෙන තිබූ බවයි. එකී අයිතිය විවාහය හා ඊට ආනුශංගික මාතෘත්වය, දික්කසාදය, නැවත විවාහය, නඩත්තු, උරුම පැවරීම ආදී සෑම කාරණයකදීම විශේෂයෙන් සැලකිල්ලට ගෙන නීතියෙන් තහවුරු කොට ඇති බව තවදුරටත් පෙන්වා දිය හැකිය.

මුඛ්‍ය පදඃ උඩරට රාජධානිය, උඩරට නීතිය, කාන්තාව